EDCS
අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society

# දිස්ත්‍රික් හා කලාප කාර්යාල සඳහා බදු පදනම යටතේ ගොඩනැගිලි ලබා ගැනීමට ටෙන්ඩර් කැඳවීමයි

සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතියේ පහත සඳහන් දිස්ත්‍රික් හා කලාප කාර්යාල පවත්වා ගෙන යාම සඳහා සුදුසු වාණිජමය ආරක්ෂිත කාර්යාලයීය ගොඩනැගිලි බදු පදනම මත ලබා ගැනීම සඳහා කෙරෙන විවෘත ටෙන්ඩර් කැඳවීමයි.

| අනු අංකය | දිස්ත්‍රික් /කලාප කාර්යාලය | ගොඩනැගිල්ල පිහිටිය යුතු නගරය | අවශ්‍ය වර්ග අඩි ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය | මොණරාගල | 3700 - 4300 |
| 02 | කුලියාපිටිය කලාප කාර්යාලය | කුලියාපිටිය | 1800 - 2000 |
| 03 | නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය | නුවරඑළිය | 3300-3500 |
| 04 | යාපනය දිස්ත්‍රික් කාර්යාලය | චාවකච්චේරිය | 1500-2000 |
| 05 | වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය | වවුනියාව | 1500-2000 |
| 06 | කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය | කෑගල්ල | 2500-3000 |

**ගොඩනැගිල්ල සම්බන්ධව සපුරාලිය යුතු සුදුසුකම්**

- ටෙන්ඩර් ඉදිරිපත් කරන ගොඩනැගිලි ඉහත සඳහන් නගරවල ප්‍රධාන මාර්ගයට හෝ අතුරු මාර්ගයකට මුහුණලා නගර ආසන්නයේ තිබිය යුතුය.
- ඉදිරිපත් කරන ගොඩනැගිල්ල කාර්යාලයක් පවත්වාගෙන යාමට සුදුසු ආකාරයෙන් තිබිය යුතු අතර පොළොව ටයිල් අතුරා තිබිය යුතුය.
- අවම වශයෙන් වාහන 02 හෝ 03 නතර කර තැබීමට ඉඩ පහසුකම් තිබිය යුතුය.
- නියම ප්‍රමිතියකින් යුක්ත සනීපාරක්ෂක පහසුකම් සහිතව අවම වශයෙන් වැසිකිළි 03 ක් වත් තිබිය යුතුය.
- ගොඩනැගිල්ල වායුසමනය කර තිබේ නම් එම වායු සමන යන්ත්‍ර සේවා කටයුතු ගොඩනැගිලි අයිතිකරු විසින් සිදු කළ යුතුය.
- ගොඩනැගිල්ල වායු සමනය රහිතව ඇත්නම් විදුලි පංකා සවිකර තිබිය යුතුය.
- වායු සමනය සහිත මිල හා වායු සමනය රහිත මිල වෙන වෙනම සඳහන් කළ යුතුය.
- ජලය හා විදුලි සැපයුම මනු කියවීම් වෙන් වෙන් වශයෙන් තිබිය යුතු අතර ජලය රැස්කර තබාගැනීම සඳහා අවම වශයෙන් ලීටර 500-1000 ක ධාරිතාවයක් සහිත ජලටැංකි තිබිය යුතුය.
- ඉදිරිපත් කරන ටෙන්ඩර්පත් සමග ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සැලැස්ම, ගොඩනැගිල්ලේ වරිපනම් අංකය, පදිංචිය සනාථ කිරීමේ සහතිකය හා ඔප්පුවේ පිටපතක් අනිවාර්යයෙන්ම අමුණා තිබිය යුතුය.
- ගොඩනැගිල්ලේ මාසික කුලිය මෙන් 6 ගුණයක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදෙනු ඇත.

  අයිතිය සනාථ කරන සහ අදාළ අනෙකුත් සියලුම ලිපි ලේඛන සමග අයිතිකරුවන් හෝ අයිතිය ඇටෝර්නි බලපත්‍රයක් මගින් හිමිකර දී ඇති ඇටෝනිලාභීන් විසින් පමණක් අදාළ මිල ගණන් වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය සඳහා 2026.04.07 දිනට පෙර හා අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල සඳහා 2026.04.14 දිනට පෙර සමිතියේ ප්‍රධාන සභාපතිට ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් පමණක් එවිය යුතු අතර, ටෙන්ඩර්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහල **"ගොඩනැගිලි බදු දීම සඳහා ටෙන්ඩර්පත් (කාර්යාලයේ නම)** සටහන් කර තිබිය යුතුය

**සැ.යු. :- ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා සකස් කරන ලද ආකෘති පත්‍රයක් ප්‍රධාන කාර්යාලය මගින් හෝ අදාළ දිස්ත්‍රික් කාර්යාල මගින් හෝ www.edcs.lk වෙබ් අඩවිය මගින් ලබාගත යුතු අතර, එම ආකෘති පත්‍රය මගින් පමණක් ටෙන්ඩර් එවිය යුතුය. ඔබ විසින් ඉදිරිපත් කරන ටෙන්ඩර්පත්වල අවසාන තීරණය ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වන අතර එම තීරණය අවසාන තීරණය වේ.**


ප්‍රධාන සභාපති
සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,
අංක 294, ගාලු පාර, කොළඹ 03. දුරකථන :- 011-2266000- EX-1019/1022